සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02යි.

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ''සොළසා සංබය පළමුව පෙරුම් පිරූ බලයෙන්දා''... මෙම කවියෙහි දෙවැනි පදය වන්නේ
(1) කළස රැගෙන මිහිකත දොස් කී අනුහස් බලයෙන්දා
(2) මෙලෙස මුණිඳු වජ්ජ්‍රාසන වැඩ හිඳ කෙළෙසුන් බින්දා
(3) සිරස නළල පැමිණි දෝස දුරලන් මුණි බලයෙන්දා
(4) සුවිසි මුණිඳු අනුහසයෙන් හැම පිරිපත හරිමින්දා

(02) තද වර්ෂාවකදී එන අකුණු හඬ ඇසීමෙන් ඇතිවන භාවය හා රසය වන්නේ
(1) පුදුමය හා වීර රසය (2) විශ්මය හා හාස්‍ය රසය
(3) භය හා භයානක රසය (4) ශෝකය හා කරුණා රසය

(03) මණ්ඩි පද හා පා සරඹ පිළිවෙලින් දැකිය හැකි නර්තන සම්ප්‍රදාය වන්නේ
(1) උඩරට හා පහතරට සම්ප්‍රදායන් (2) පහතරට සහ උඩරට සම්ප්‍රදායන්
(3) සබරගමු හා පහතරට සම්ප්‍රදායන් (4) පහතරට හා උඩරට සම්ප්‍රදායන්

(04) ''ලොව සෙත් කරවන පත්තිනි සඳි නේ...'' මෙය
(1) ලි කෙළි කවියකි (2) සවරං කවියකි (3) තාලම් කවියකි (4) පතුරු කවියකි

(05) ''ගොයම් කැපීමේ නැටුම'' හා ''නාරිලතා නැටුම'' නූතන වේදිකාවට සකස් කළ ශිල්පියා වන්නේ
(1) ඇස්. පණීභාරත මහතා (2) කේ.එස්. ප්‍රනාන්දු මහතා
(3) ඩී.වී.හීන්නිලමේ මහතා (4) ජේ.ඊ. සේදරමන් මහතා

(ලකුණු 1 × 5 = 05)

- ප්‍රශ්න අංක 06-10 දක්වා ඇති ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) වැරදි ලකුණද වරහන් තුළ යොදන්න.

(06) චරිතයක් නිරූපනයකිරීමේදී චරිත ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. ( )

(07) ලංකාවේ නර්තන කලාව හා සම්බන්ධ ගල්කැටයම් ඇම්බැක්කේ දේවාලයේදී දැකිය හැකිය. ( )

(08) සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව පහතරට බෙරයේ දිග තුන්වියත් තුනඟුලකි. ( )

(09) ශාන්ති කර්ම වලදී මූලික චාරිත්‍රයක් ලෙසින් කප් සිටුවීම සිදු කරනු ලැබේ. ( )

(10) දේශීය තාල පද්ධතියේ දෙතිතේ තාල ප්‍රභේද හතරක් (04) භාවිතා වේ. ( )

(ලකුණු 1 × 5 = 05)

- ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුරු යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| (11) | දුර්ගා දෙවියන් | 1. | පහතරට බෙරය |
| (12) | නට්ටුවාංගම් | 2. | ගොප් කලාව |
| (13) | බීජාක්ෂර | 3. | උඩරට |
| (14) | කොහොඹාකංකාරිය | 4. | භරත නර්තනය |
| (15) | කට්ට කොල | 5. | නවරාත්‍රී උත්සවය |

(ලකුණු 1 × 5 = 05)

- **16 - 20 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(16) නර්තනය, ගායනය, වාදනය යන ක්‍රියාවලි තුනෙහිම තාල තැබීම සඳහා .......................... යොදා ගනී.

(17) පහතරට බෙරය ..................................... නමින්ද හඳුන්වයි.

(18) ''දී කිරි දී කිරි ගෙනාව දී කිරි'' යන නාට්‍ය ගීතය ................................... නාට්‍යයේ එන ගීතයකි.

(19) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය .................................... නර්තන සම්ප්‍රදාය සඳහා භාවිතා කරයි.

(20) සන්නියකුම හෙවත් දහ අට සන්නිය කෘතිය ....................................... මහතා විසින් රචනා කරන ලදී.

(ලකුණු 1 × 5 = 05)

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(01) (i) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ............................ කර්මයයි

(ii) මණ්ඩියට සිටීමේදී විලුම් දෙක අතර දුර ප්‍රමාණය ............................. කි.

(iii) විලම්භ ලයෙහි දෙගුණය ............................... ලය වේ.

(iv) නර්තනයට අවශ්‍ය පරිදි ශරීරාංග හැඩ ගස්වා ගැනීම සඳහා ................................ අභ්‍යාස වැදගත් වේ.

(v) ........................... විතතාත ගණයට අයත් වාද්‍ය භාණ්ඩයකි.

(vi) මාත්‍රා 3 + 3 තාල රූපය ...................... තනි තිත නමින් හැඳින්වේ.

(vii) භරත නර්තන සම්ප්‍රදායේ මූලික ඉරියව්ව........................... නමින් හැඳින්වේ.

(viii) ජීවන වෘත්තීන් හා බැඳී නර්තන අංගයක් ලෙස........................... දක්විය හැකිය.

(ix) නර්තනය ආරම්භ කිරීමට පෙර සහ නර්තනය අවසාන කිරීමෙන් පසු ............................. කිරීම සම්ප්‍රදායන් තුනෙහිම දැකිය හැකිය.

(x) පහතරට බෙරය සැකසීම සඳහා යොදා ගනු ලබන දැව වර්ගයකි. .................................................

(02) (i) මාත්‍රා 3 + 3 ට අයත් බෙර පදයක් ප්‍රස්තාර ගත කරන්න.

(ii) වෛරොඩි වන්නම/ඊශ්වර කුණ්ඩතාලය සින්දු වන්නම/ කදම්හ පක්ෂි වන්නමට අදාළ තානම, කවියක් ලියන්න.

(iii) මාත්‍රා 4 + 4 තිතට ගායනා කළ හැකි ජන කවියක් ලියා දක්වන්න.

(03) (i) පහතරට බෙරය වාදනය කරන අවස්ථා 2ක් නම් කරන්න.

(ii) පහතරට බෙරයෙන් නිකුත් වන සතර බීජාක්ෂර ලියා දක්වන්න.

(iii) පහතරට බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් 4ක් නම් කරන්න.

(04) (i) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන ශාන්ති කර්ම තුන ලියන්න.

(ii) ඔබ හදාරන නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයේදී පුද ලබන දෙවිවරු දෙදෙනක් සහ චාරිත්‍ර විධි 02 ක් ලියන්න.

(iii) ශාන්ති කර්ම පැවැත්වීමේදී සාමුහිකත්වයෙන් කටයුතු කිරීම තුළින් පුද්ගලයකු තුළ ඇතිවන යහපත් ගුණාංග පිළිබඳව අදහස් දක්වන්න.

(05) ''දළදා පෙරහැර දේශයේ ප්‍රෞඪත්වය හා අභිමානය පෙන්නුම් කරන ජාතික උත්සවයකි''

(i) දළදා පෙරහැර පැවැත්වීමේ අරමුණු ලියන්න.

(ii) දළදා පෙරහැර හා සම්බන්ධ චාරිත්‍ර විධි 05ක් ලියන්න.

(iii) පෙරහැරෙහි දක්නට ලැබෙන නර්තන අංග හා වාදන අංග පිළිබඳව විස්තර කරන්න.

(06) පහත සඳහන් මාතෘකා වලින් 02ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.(එක් මාතෘකාවකින් කරුණු 5ක් සඳහන් කරන්න)

(i) නවරාත්‍රී උත්සවය

(ii) එස්. පණිභාරත මහතා

(iii) නම්‍යතා අභ්‍යාස

(iv) ගොප් ගෙඩිය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**8 - ශ්‍රේණිය**

**නර්තනය (දේශීය)**

**ප්‍රායෝගික පරීක්ෂණය**

**නම/විභාග අංකය :- ..........................................................**

(01) (i) කැමති ගායනයක් (ලකුණු 05)

(ii) නම් කරන ලද ගායනයක් (ලකුණු 05)

(මුළු ලකුණු 10)

(02) (i) ගොඩ සරඹයක් නර්තනය (ලකුණු 05)

(ii) කස්තිරම/ඉරට්ටිය/කලාසම (ලකුණු 05)

(මුළු ලකුණු 10)

(03) (i) වෛරොඩි වන්නම/ඊශ්වර කුණ්ඩතාලය / කදම්භ පක්ෂී වන්නම නර්තනය

(ලකුණු 20)

(04) (i) ගැමි නැටුමක් නර්තනය (ලකුණු 10)